# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2456/42 - 2025 ඔක්තෝබර් මස 01 වැනි බදාදා - 2025.10.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංකය: 96

**2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත (සංශෝධිත)**

12 (1) වගන්තිය යටතේ විධානය

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12 (1) වැනි වගන්තිය යටතේ ක්‍රියාකරමින් දේශීයව නිෂ්පාදනය කරන පහත සඳහන් කරනු ලබන ප්‍රමිති පිරිවිතරවලින් ආවරණය වන භාණ්ඩ වර්ග, කිසිම නිෂ්පාදකයෙකු, අසුරන්නෙකු, බෙදාහරින්නෙකු, ප්‍රවාහනය කරන්නෙකු, ගබඩා කරන්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් **ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරනු ලබන SLS භාණ්ඩ සහතික ලාංඡනය දරන්නේ නම් මිස** එකී භාණ්ඩ වර්ග නිෂ්පාදනය කිරීම, ඇසිරීම, බෙදාහැරීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම හෝ විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් විධානය කරනු ලැබේ.

එසේම, ආනයනය කරනු ලබන පහත සඳහන් ප්‍රමිති පිරිවිතරවලින් ආවරණය වන භාණ්ඩ, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් 1987 අංක 28 හා 1985 අංක 48 දරන පනත්වලින් සංශෝධිත 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 20 වන වගන්තිය යටතේ ප්‍රකාශිත 2006 ආනයන (ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය) රෙගුලාසි යටතේ ක්‍රියාත්මක කරනු ලබන ආනයන පරීක්ෂණ ක්‍රමය යටතේ පරීක්ෂා කර විකිණීම සඳහා අනුමත කර ඇත්නම් මිස, කිසි ම ආනයනකරුවෙකු, අසුරන්නෙකු, බෙදාහරින්නෙකු, ප්‍රවාහනය කරන්නෙකු, ගබඩා කරන්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් **එකී භාණ්ඩ ආනයනය** කිරීම, ඇසිරීම, බෙදාහැරීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම හෝ විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවටත් මෙයින් විධානය කරනු ලැබේ.

(i) දියරමය පාන රැගෙන යාමට එක් වරකට වඩා භාවිතා කිරීමට සුදුසු ප්ලාස්ටික් බෝතල් සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතරය (Sri Lanka Standard Specification for Reusable Plastic Bottles for Carrying Drinkable Liquids) - SLS 1616

(ii) ළදරුවන්ට ආහාර ලබාදීම සඳහා ප්ලාස්ටික් ද්‍රව්‍යවලින් සාදන ලද බෝතල් සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතරය (Sri Lanka Standard Specification for Feeding Bottles Made of Polymer Materials) - SLS 1306



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ඉහත සඳහන් ප්‍රමිතීන් සම්බන්ධයෙන් ඉදිරියේදී සිදුකරනු ලබන සියළු සංශෝධනයන්ට මෙම විධානය යටත් වේ.

මෙම විධානය 2026 අප්‍රේල් 01 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

**හේමන්ත සමරකෝන්,**
සභාපති.

2025 ඔක්තෝබර් මස 1 වැනි දින,
කොළඹ දී ය.

EOG 10 - 0011

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.